ගරු අමාත්‍යතුමා
மாண்புமிகு அமைச்சர்
Hon. Minister
Tel.: +94 11 2435248
Fax: +94 11 2390885
E-mail : minister@industry.gov.lk

ලේකම්
செயலாளர்
Secretary
Tel.: +94 11 2436123
+94 11 2436124
Fax: +94 11 2449402

අමාත්‍යාංශය
அமைச்சு
Ministry
Tel.: +94 11 2392149
+94 11 2392150
Web: www.industry.gov.lk
Fax: +94 11 2390941/ 2332444

විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E-mail
secretary@industry.gov.lk

# කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
# கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு
# Ministry of Industry and Entrepreneurship Development

තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව./ த.பெ. இல. 570, 73/1, காலி வீதி, கொழும்பு 03, இலங்கை.
P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. MIED/ADM/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026.07.22

කර්මාන්ත චක්‍රලේඛ අංක: 01/2026

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
සහ ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම් ප්‍රවාහනය සහ වෙළඳාම සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරිම.</u>**

" ඉදිකිරිම් කර්මාන්තය සඳහා භාවිතා කරන ඛනිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහය" සඳහා අංක 21/1766/31/022 හා 2021.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී ඇත. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට පත්වීමෙන් පසුව ඉහත කී කාර්යය සංග්‍රහයට අදාළව මෙම අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2026.06.23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දෙන ලද අංක අමප/26/1298/810/040 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබාදුන් නියෝග පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

" ඉදිකිරිම් කර්මාන්තය සඳහා භාවිතා කරන ඛනිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ" (ඇමුණුම.01- https://www.industry.gov.lk/web/wp-content/uploads/2026/07/Manual-on-Excavation-Transportation-and-Trade-of-Minerals-used-in-the-Construction-Industry-Sinhala.pdf ) විධිවිධාන අනුව සියලුම ආයතන ප්‍රධානීන් විසින් කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම්, ප්‍රවාහනය හා වෙළඳාම ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. මෙම කාර්යය සංග්‍රහය සඳහා ඉහත සඳහන් පරිදි අංක අමප/26/1298/810/040 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබාදුන් අනුමැතිය ප්‍රකාරව කාර්යය සංග්‍රහයේ සඳහන් පරිසර අමාත්‍යාංශය යන යෙදුම වෙනුවට "කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය" යන්න ආදේශ කල යුතු වේ.

තවද,කාර්ය සංග්‍රහයේ පහත සඳහන් කරුණු සම්බන්ධව ඔබගේ විශේෂ අවධානය යොමු විය යුතුය.

01. කැණීම් කල හැකි ස්ථාන හා අවකාශ හඳුනා ගැනීම

1.1 භූ සම්පත් කැණීම් කල හැකි ස්ථාන පිළිබඳව කල් ඇතිව හඳුනා ගැනීම, ඒවා සිතියම් ගත කිරීම, එම භූ සම්පත් අයත්වන ආයතන හඳුනා ගැනීම හා අවශ්‍ය නිෂ්කාශන සහතික ලබා ගැනීම වැනි කාර්යයන් ඒකීය ආයතනික ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක කිරීමට ඉහත කාර්ය සංග්‍රහය මඟින් යෝජිතය. කැණීම් කල හැකි ස්ථාන හා අවකාශ හඳුනා ගැනීමේදී, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව හා නිෂ්කාශන නිකුත් කිරීම සඳහා වගකීම් දරන අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන තම වගකීම් මැනවින් ඉටු කිරීමට වගබලා ගතයුතු වේ.

02. බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය

2.1 කාර්යය සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන අනුව අදාළ බලපත්‍ර නිකුත් කිරීමට ඒ ඒ රාජ්‍ය ආයතන විසින් පියවර ගත යුතුය.

2.2 විශේෂයෙන්ම, කැණීම් බලපත්‍රවලට අදාළව ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන සියලු නිෂ්කාශනවල වලංගු කාලසීමාවේ කාලය ආරම්භ විය යුත්තේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයේ ආරම්භක දිනයේ සිටය.

03. රාජ්‍ය ඉඩම් හිමිකාරිත්වය / කළමණාකාරීත්වය දරන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉඩම් පරිහරණය සඳහා පරිසර ඇගයීම් සහතික නිකුත් කිරීම.

3.1 රජයේ ඉඩම් පරිහරණ එකඟතාවයන් හා පරිසර සහතික නිකුත් කිරීමේදී නියමිත කාලසීමාව තුළ එම එකඟතාවයන් ලබාදීම රජයේ ආයතනවල වගකීම වේ. එසේම මෙම එකඟතාවයන් ලබා දීමේදී ක්‍රමවේදයන් සරල කිරීමට ද ආයතන ප්‍රධානීන් විසින් නියමිත නීති රෙගුලාසි තුළ අවශ්‍ය පියවර ගත යුතු වේ.

04. ගාස්තු අයකිරීම්

කාර්යය සංග්‍රහයේ 6 වන පරිච්ඡේදයේ සඳහන් "බලපත්‍ර / නිෂ්කාශන ගාස්තු, වෙනත් ගාස්තු අය කිරීම, ආපසු ගෙවීම සහ ගිණුම්ගත කිරීම පිළිබඳ ඒකීය ක්‍රමවේදය" 2026 සැප්තැම්බර් මස පළමුවන (01) දින සිට ක්‍රියාත්මක කිරීමට අදාළ සියලුම රාජ්‍ය ආයතන පියවර ගතයුතු වේ.

05. පාරිසරික ගැටලු, මහජන විරෝධතා හා අධීක්ෂණය

5.1 ඛනිජ සම්පත් පරිසරයෙන් ලබා ගැනීමේ දී පරිසරයට වන බලපෑම් හැකිතාක් අවම කිරීමට සියලු පාර්ශවයන් වගබලා ගත යුතුය.

5.2 කැණීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධා ගැටලු නිරාකරණය කිරීම සඳහාත් එම ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහාත් භූ සම්පත් කැණීම පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුවක් හා දිස්ත්‍රික් අධීක්ෂණ කමිටු පිහිටුවිය යුතුවේ.

5.2.1 දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නියෝජිතයන් ඇතුළත්ව "භූ සම්පත් කැණීම් පිළිබඳ දිස්ත්‍රික් අධීක්ෂණ කමිටු" පිහිටුවිය යුතුය. කාර්යාංශයේ දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු විසින් කමිටුව සම්බන්ධීකරණය කළ යුතු අතර, මෙම කමිටුව මසකට වරක් රැස්විය යුතුය.

5.2.2 දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුව මගින් නිරාකරණය කර ගැනීමට නොහැකි කරුණු ඇත්නම් ඒවා "භූ සම්පත් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව" වෙත යොමු කළ යුතුය.

5.2.3 කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන්, ස්වදේශ කටයුතු, පළාත් පාලන, මහා මාර්ග, වාරිමාර්ග, ඉඩම්, වනජීවී හා වන සම්පත් සහ මුදල් යන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නම් කරන නියෝජිතයන්ගෙන් හා කාර්යය සංග්‍රහයේ උපලේඛන 01 හි සඳහන් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් / නියෝජිතයින්ගෙන් "භූ සම්පත් කැණීම් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව" සමන්විත වේ. මෙම කමිටුව මාස 03 කට වරක් රැස්විය යුතුය.

අදාළ සියලුම රාජ්‍ය ආයතන ඉහත චක්‍රලේඛයේ උපදෙස් අනුව ක්‍රියා කර වඩාත් ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් මහජන යහපත උදෙසා කළමනාකරණය කරනු ඇතැයි හුදෙක්ම විශ්වාස කරමි. චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදි යම් කිසි ගැටලුවක් මතුවුවහොත් ලේකම්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කල යුතුය.

**ලේකම්**
**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

පිටපත්

1. ජනාධිපති ලේකම් : කරු. දැ. ගැ. ස
2. අග්‍රාමාත්‍ය ලේකම් : කරු. දැ. ගැ. ස
3. විගණකාධිපති : කරු. දැ. ගැ. ස
4. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය : කරු. දැ. ගැ. ස හා අ. ක. ස